# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,489—1965 අගෝස්තු 24 වැනි අඟහරුවාද—1965.8.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### අංක 1,073ජ් දරණ පැවරුම් නියෝගය

#### හලා/ශාන්ත මේරි පිරිමි පාසල, මාරවිල

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල අනුව, මීට යාකොට දැක්වෙන උපලේඛනයෙහි විශේෂ කොට විස්තර කොට ඇත්තාවූද, පවරාගනු ලැබියහැකිවූ ද, දේපොල සියල්ලම 1965 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 15 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි රජයට පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

##### උපලේඛනය

1. 1960 වර්ෂයේ ජූලි මාසයේ 21 වෙනි දින, මාරවිල, හලා/ශාන්ත මේරි පිරිමි පාඨශාලාව පවත්වනු ලැබුවාවූත්, නඩත්තු කරනු ලැබුවාවූත්, ස්ථානය, එනම් :—

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලයේ මාරවිල පරගස්යායට අයිති තල්ගහවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩමෙන් කොටසක් වූත්,

උතුරෙන් : දෙවස්ථානයට අයිති ඉඩමෙන් ද; එනම් උතුරු පැත්තේ ඇති පාඨශාලා ගොඩනැගිල්ලේ උතුරු බිත්තියේ සිට අඩි 3 ක් උතුරට එම බිත්තියට සරල සමාන්තරව සිටිනසේ බටහිර සිට නැගෙනහිරට දිවෙන රේඛාවකින්ද;

නැගෙනහිරෙන් : පාසල් ගොඩනැගිලි දෙකේම නැගෙනහිර බිත්ති වල සිට අඩි 3 ක් නැගෙනහිරට එම බිත්ති වලට සරල සමාන්තරව සිටිනසේ උතුරේ සිට දකුණට දිවෙන රේඛාවකින් ද;

දකුණෙන් ; මුහුදු වෙරල දිසාවට දිවෙන පල්ලිය පාරෙන් ද;

බටහිරෙන් : ඇම්. ඊ. ලාසරස් අප්පුහාමිට අයත් ඉඩමෙන් ද මායිම්වූත් පාර්චස් 30 5/6 පමණ විශාලවූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයෙහි 1 වන ඡේදයෙහි වෙසෙසා දැක්වෙන ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅබ/270/සාපා
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

8-924/1

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

#### කො/කෝට්ටේ රජමහා විහාර පාසල, කෝට්ටේ

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින් 1962 වර්ෂයේ නොවැම්බර් මස 10 වෙනි දින අංක 13 389 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 2090 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කොට දක්වෙන දේපොල වලට අදාලවන තාක් දුරට 1965 ජනවාරි මස 26 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅට/606
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

##### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලි තුමාගේ කොට්ඨාශයේ, පිටකෝට්ටේ පිහිටියාවූත්, උතුරින් රජමහා විහාර පාරෙන් හා රජමහා විහාරයට ලඟාවන පාරෙන්ද, නැගෙනහිරින්, එකී රජමහා විහාරයට ලඟාවන පාරේ එක් ලක්ෂයකින් ආරම්භව අඩි 65× අඩි 35 පාසැල් ගොඩනැගිල්ලේ නැගෙනහිර බිත්තියේ සිට අඩි 34 ක් දුරින්ද, ඉතා නැගෙනහිරින් පිහිටි වැසිකිළි ගොඩනැගිල්ලේ නැගෙනහිර බිත්තියට අඩි 3 ක් නැගෙනහිරින්ද වැටෙනසේ එකී වැසිකිළි ගොඩනැගිල්ලේ සිට අඩි 10 ක් දකුණින් හා එයට සමාන්තරව විහිදෙන රේඛාවක් සමුවන තෙක් දකුණු දෙසට විහිදී යන රේඛාවකින්ද, දකුණින්, මෙහි විස්තර කොට තිබෙන නැගෙනහිර මායිමේ දකුණු කෙලවරින් ආරම්භව, මිටිහාන පාර සමුවන තෙක් බස්නාහිර දෙසට විහිදෙන රේඛාවකින්ද, බස්නාහිරින්, දකුණු මායිමේ බස්නාහිර කෙලවරින් ආරම්භව අඩි 39× අඩි 15 පාසැල් ගොඩනැගිල්ලට අඩි 34 ක් බස්නාහිරින් ගොස් එකී රජමහා විහාර පාර සමුවන තෙක් උතුරු දෙසට විහිදෙන රේඛාවකින්ද මායිම්වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයේ 1 වෙනි ඡේදයෙහි වෙසෙසා දැක්වෙන ඉඩමේ පිහිටි සියලුම ගොඩනැගිලි හා නිර්මාණයන්,

8-924/2

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

### කො/රාගම (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසල

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බල තල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ ජූලි මස 23 වෙනි දින අංක 13,225 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1560 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දක්වෙන දේපොළ වලට අදාලවන තාක් දුරට, 1962 වර්ෂයේ අගෝස්තු මස 15 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅද/729
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, රාගම පිහිටි කො/රාගම (රෝමානු කතෝලික) පිරිමි පාසලට අයත් ඉඩමේ (ප්‍රතිමාවක් පිහිටි) මෙහි පහත දක්වන පරිදි මායිම්වූ භූමි භාගය :—

උතුරට : ප්‍රතිමාව පිහිටි, ප්‍රතිමා ස්ථලයේ ඊසානදිග කෙළවරේ සිට හරි කෙලින් අඩි 12 ක් ඈතින් පොල්ගස් 2 ක් ඇතුලත් වනසේ, දේවස්ථානයට යන එන මාර්ගයේ සිට බටහිර දෙසට අඩි 40 ක් විහිදෙන සෘජු රේඛාවකින් ;

දකුණට : පවරාගත් ඉඩමේ ඈතට පවත්නා දකුණු මායිමට අඩි 10 ක් උතුරෙන් ඊට සමාන්තරව විහිදෙන සෘජු රේඛාවකින් ;

නැගෙනහිරට : දේවස්ථානයට යන එන මාර්ගයෙන් ;

බටහිරට : ප්‍රතිමාව පිහිටි ප්‍රතිමා ස්ථලයේ බටහිර කෙළවරේ සිට හරිකෙලින් අඩි 26 කට ඈතින් ප්‍රතිමාවට පිටිපස පිහිටි පොල් ගස් 2 ක් ඇතුලත්වන සේ උතුරු මායිමේ බටහිර කෙලවරින් පටන්ගෙන අඩි 50 ක් දකුණු දිගට හරි කෙලින් විහිදෙන ප්‍රක්ෂේපකයකින්.

2. මෙම උපලේඛනයෙහි 1 වැනි ඡේදයෙහි විශේෂකොට දැක්වුනු ඉඩමෙහි ඇති සියළුම ගොඩනැගිලි හා වෙනත් නිර්මාණයන්.

8-924/3

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

### මී/කමරගොඩ (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල, දෙවිලපොල

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම. 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1963 වර්ෂයේ අප්‍රේල් මාසයේ 6 වෙනි දින අංක 13.594 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 2495 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොලවලට අදාලවනතාක් දුරට, 1963 වර්ෂයේ මැයි මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅද/1021
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, කමරගොඩ පිහිටියාවූත්, නැගෙනහිරින්, දෙවිලපොල-ගල්කන්ද ගම් කාර්ය සහා පාරෙන්ද, දකුණින්, 1963 වර්ෂයේ අප්‍රේල් මාසයේ 6 වෙනි දින අංක 13.594 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 2495 දරණ පැවරුම් නියෝගයේ 1 (ඒ) ඡේදයෙහි විස්තර කොට ඇති ඉඩමෙහි දකුණු මායිම ඔස්සේ පෙර කී ගම් කාර්ය සහා පාරේ සිට අඩි 67ක් බටහිර දෙසට විහිදෙන රේඛාවකින්ද, බටහිරින්, පෙර කී ගම්කාර්ය සහා පාරේ සිට අඩි 67ක් බටහිරින්, එකී දකුණු මායිමේවූ ලක්ෂ්‍යයකින් ඇරඹී අඩි 69ක දුරක් උතුරු දෙසට දිවෙන රේඛාවකින්ද, උතුරින්, එකී බටහිර මායිමේ, උතුරු කෙලවරේ සිට පෙර කී දෙවිලපොල-ගල්කන්ද ගම්කාර්ය සහා පාර තෙක් විහිදෙන රේඛාවකින්ද මායිම්වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

8-924/4

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

### කු/වල්පාලුවත්ත සිංහල මිශ්‍ර පාසැල, ඇහැටුවැව

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ අගෝස්තු මස 13 වෙනි දින අංක 13261 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1741 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දක්වෙන දේපොල වලට අදාල වනතාක් දුරට 1963 වර්ෂයේ ජූලි මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅඹ/88/සාපා
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

#### උපලේඛනය

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාහෝ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ හිද්දැවේ පිහිටියාවූත්, හැලඹගහ වත්ත නමින් හැඳින්වෙන්නාවූ ඉඩමෙන් කොටසක්වූත් :—

උතුරෙන් : පාඨශාලා ගොඩනැගිල්ලේ උතුරු බිත්තියේ සිට අඩි 30ක් උතුරෙන්වූ රේඛාවකින්ද ;

නැගෙනහිරෙන් : පාඨශාල ගොඩනැගිල්ලේ නැගෙනහිර බිත්තියේ සිට අඩි 72ක් නැගෙනහිරෙන්වූ රේඛාවකින්ද ;

දකුණෙන් : පාඨශාලා ගොඩනැගිල්ලේ දකුණු බිත්තියේ සිට අඩි 28ක් දකුණෙන් වූ රේඛාවකින් හා ගම්කාර්ය සභා පාරෙන්ද ;

බටහිරෙන් : ගම්කාර්ය සභා පාරෙන්ද, මායිම්වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයෙහි 1 වෙනි ඡේදයෙහි වෙසෙසා දැක්වෙන ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

8-924/5

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

### පු/පෙරකුඹවටාන රෝමානු කතෝලික මිශ්‍ර පාසැල, කොත්තන්තිව්

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම. 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, 1962 වර්ෂයේ නොවැම්බර් මස 10 වෙනි දින අංක 13.339 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 2123 දරන පැවරුම් නියෝගය මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොලවලට අදාලවනතාක් දුරට, 1962 වර්ෂයේ දෙසැම්බර් මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅඹ/343/සාපා,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

#### උපලේඛනය

1. වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පෙරකුඹවටාන පිහිටියාවූත් පෙරකුඹවටාන

රෝමානු කතෝලික මිශ්‍ර පාසැල් ඉඩම නමින් හැඳින්වෙන්නාවූත්,

උතුරෙන් : ඊ. ඇස්. ඇම්. වතුයායෙන් ද ;

නැගෙනහිරෙන් : ප්‍රැන්ක් ද කොස්තා මහතා විසින් හිමිකම් කියන ඉඩමෙන් ද ;

දකුණෙන් : පිලිප් ප්‍රුවන් මහතා විසින් හිමිකම් කියන ඉඩමෙන් ද ;

බටහිරෙන් : ඊ. ඇස්. ඇම්. වතුයායෙන් ද, මායිම්වූත් අක්කර පහක් පමණ (අ. 5, රු. 0, ප. 0.) විශාලවූත් ඉඩම් කොටස සහ දැනට පාසැලට යාම් ඊම් සඳහා ඇති ප්‍රවේශ මාර්ගය ප්‍රයෝජනයට ගැනීමේ අයිතිය සහිතව සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයේ 1 වන ඡේදයෙහි දැක්වෙන ඉඩමෙහි පිහිටි සියලුම ගොඩනැගිලි හා නිර්මාණයන් ඇතුලත් වය.

8-924/6

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

### යා/කලඩ්ඩි මෙතෝදිස්ත මිසමේ දෙමළ මිශ්‍ර පාසැල

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සෙලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින් 1962 වර්ෂයේ ජනවාරි මස 15 වෙනි දින අංක 12,849 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1962 වර්ෂයේ ජනවාරි මස 8 වෙනි දින දාතමින් යුත් අංක 631 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොල වලට අදාලවනතාක් දුරට 1962 වර්ෂයේ පෙබරවාරි මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජීඑස්/එන්එස්ඒඑච්/10,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්ව මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 වන දින දීය.

### උපලේඛනය

1. (ඒ) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ යාපනය කොට්ඨාශයේ නැගෙනහිර වන්නාර්පොන්නයිහි පිහිටියාවූද, මනිපායිහි බලය ලත් මැනුම්කරු හා මට්ටම්කරු ඇස්. මුතුකුමාරසාමි මහතා විසින් සාදන ලද 1962.6.22 දින හා අංක 1992 දරණ පිඹුරේ අංක 2 බිම් කැබැල්ල ලෙස දක්වා ඇත්තාවූද, ඉඩම් කැබැල්ලෙන් කොටසක්, එනම්, උතුරින් : නැගෙනහිර සිට බස්නාහිරට වැටී ඇති පටු පාරේ, කොටසකට සමාන්තරව, එකී පටු පාරේ සිට අඩි 33ක් දකුණු දෙසින් විහිදෙන රේඛාවකින් ද ; නැගෙනහිරින් : මනිපායිහි බලය ලත් මැනුම්කරු හා මට්ටම්කරු ඇස්. මුතුකුමාරසාමි මහතා විසින් සාදන ලද ඉහත කී පිඹුරේ අංක 3 ලෙස දැක්වෙන බිම් කැබැල්ලේ නැගෙනහිර මායිම වශයෙන් පෙන්නුම් කොට තිබෙන, උතුරේ සිට දකුණට වැටී ඇති පටු මාවතේ කොටසක සිට අඩි 102ක් බස්නාහිරින් විහිදෙන රේඛාවකින් ද ; දකුණින් : පාරෙන් ද ; බස්නාහිරින් : ඇස්. මුතුකුමාරසාමි මහතා විසින් සාදන ලද 1962.6.22 දින හා අංක 1992 දරන එකී පිඹුරේ සඳහන් අංක 1 දරන බිම් කැබැල්ලෙන් ද මායිම් වූ ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

(බී) එකී ඇස්. මුතුකුමාරසාමි මහතා විසින් සාදන ලද 1962 6 22 දින හා අංක 1992 දරන පිඹුරේ දැක්වෙන අංක 1 දරන බිම් කැබැල්ල අයිතිකරුට හා ඔහුගේ අනුප්‍රාප්තිකයන්ටද එකී අංක 1 දරන බිම් කැබැල්ලෙහි හෝ අංක 2 දරන බිම් කැබැල්ලෙන් අස් කළ කොටසෙහි හෝ ළිඳක් සාදා ගන්නා තෙක් පාසැල් ළිඳෙන් වතුර ඇද ගැනීමට හිමිකම තිබේ. කැමැත්තෙහි නම්, ළිඳට පොම්පයක් යොදා වතුර ඇද ගැනීමටද අයිතිකරුවන්ට හිමිකම් ඇත.

8-924/7

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

### මඩ/පුතුමුහතුවාරම් (රෝමානු කතෝලික) දෙමළ මිශ්‍ර පාසැල, මඩකලපුව

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති තැන්පත් ඉමියා මුදියන්සෙලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, 1963 වර්ෂයේ පෙබරවාරි මස 11 වෙනි දින අංක 13,018 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1963 පෙබරවාරි මස 5 වෙනි දින දාතමින් යුත් අංක 2449 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොලවලට අදාළ වන තාක් දුරට 1963 මාර්තු මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජීඑස්/එන්එස්ඒඑච්/621,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්ව මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තුවේ කලඩි මුහතුවාරම් නමැති ගමේ පිහිටියාවූත්, බලය ලත් මිනින්දෝරු හා මට්ටම්කරු තැන්පත් ඒෆ්. ආර්. තිස්සවීරසිංහ, ඒෆ්. එස්. අයි. (ලංකාව) මහතා විසින් සකස් කරන ලද 64.10.30 දින අංක 480/64 දරන පිඹුරෙහි අංක 1 දරන බිම් කට්ටියෙන් කොටසක් වූත්, එකී අංක 480/64 දරන පිඹුරෙහි අංක 1ඒ බිම් කට්ටිය වශයෙන් දැක්වෙන්නාවූත්, බටහිරින් හා උතුරින් එකී අංක 480/64 දරන පිඹුරෙහි අංක 2 දරන බිම් කට්ටියෙන් ද, නැගෙනහිරින් එකී අංක 480/64 පිඹුරෙහි එකී අංක දරන බිම් කට්ටියේ ඉතිරි කොටසින් ද, දකුණින් පුද්ගලික ඉඩමකින් ද මායිම්වූත් පර්චස් දාහතයි දශම හයක් (අ. 0, රු. 0, ප. 17.6) විශාලවූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

8-924/8

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

### කො/යක්කඩුව රෝමානු කතෝලික මිශ්‍ර පාසැල, ජාඇල

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/755,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු 18 වැනි දින දීය.

### නියෝගය

1962 මාර්තු මස 6 වැනි දින අංක 12,951 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලවූ, ජාඇල, කො/යක්කඩුව රෝමානු කතෝලික මිශ්‍ර පාසැල පිළිබඳ වූ අංක 845 දරණ පැවරුම් නියෝගයේ එහිවූ උපලේඛනයේ 1 වැනි ඡේදය වෙනුවට මතු දැක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1(ඒ) 1960 ජූලි මස 21 වැනි දින, ජාඇල, කො/යක්කඩුව රෝමානු කතෝලික මිශ්‍ර පාසැල පවත්වා නඩත්තු කරනු ලැබූ ස්ථානය එනම් : බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ... කුරු කෝරලේ රාගම් පත්තුවේ යක්කඩුවෙහි පිහිටි—

උතුරෙන් : පාසැලේ වැසිකිළි ගොඩනැගිල්ලට සමාන්තරව, එම ගොඩනැගිල්ලට අඩි 10 ක් උතුරෙන් විහිදෙන රේඛාවකින් ද ;

නැගෙනහිරින් : සී. පී. මල්ලවාරච්චි සහ ඇස්. සී. සෙනේ... අප්පු නැමති අයට අයිති ඉඩම් වලින් ද ;

දකුණෙන් : සාදාගෙන යන දකුණු පාසැල් ගොඩනැගිල්ලේ දකුණු බිත්තියට සමාන්තරව එම බිත්තියට අඩි 20 ක් දකුණෙන් විහිදෙන රේඛාවකින් ද ;

බස්නාහිරින් : උතුරු පාසැල් ගොඩනැගිල්ලේ බස්නාහිර බිත්තියට සමාන්තරව එම බිත්තියට අඩි 40ක් බස්නාහිරින් විහිදෙන රේඛාවකින් ද, මායිම්වූ ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

(බී) මෙම උපලේඛනයේ 1(ඒ) ඡේදයෙන් විශේෂ කොට දක්වෙන ස්ථානයට, ජාඇල-ගනේමුල්ල රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරෙන් ප්‍රවේශවීමේ අයිතිවාසිකම."

8-924/9

## 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

### ක/මොල්ලිගොඩ (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල, වාද්දුව

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජපාඅද/935,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

### නියෝගය

වාද්දුවේ, ක/මොල්ලිගොඩ (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාඨශාලාව සම්බන්ධයෙන් 1962 වර්ෂයේ මැයි මාසයේ 29 වෙනි දින අංක 13,133 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ අංක 1340 දරන පැවරුම් නියෝගය, එහි උපලේඛනයේ 1 වෙනි ඡේදය වෙනුවට මතු දක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1. වාද්දුවේ ක/මොල්ලිගොඩ (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාඨශාලාව 1960 ජූලි මස 21 දින පවත්වනු ලැබුවාවූත්, නඩත්තු කරනු ලැබුවාවූත් ස්ථානය; එනම්—බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ පත්තුවේ මොල්ලිගොඩ පිහිටියාවූත් කොරවුවෙ-වත්ත නමින් හැඳින්වෙන ඉඩමේ කොටසක් වූත් උතුරින් : බලයලත් මැනුම්කරු හා මට්ටම්කරු එච්. අනිල් පීරිස් මහතා විසින් සාදනලද 65.2.28 දින හා අංක 204 දරණ පිඹුරේ දක්වෙන පරිදි ඇල්. ඇස්. ජේ. පෙරේරාට අයිති ගොඩපොරගහවත්ත නමැති ඉඩමෙන් ද, නැගෙනහිරින් : එකී අංක 204 දරණ පිඹුරේ දක්වෙන පරිදි, මෙතියෙස් පෙරේරාට, ඇල්. පීටර් පෙරේරාට සහ වෙනත් අයට අයත් ඉඩම්වලින් ද ; දකුණින් : එකී අංක 204 දරණ පිඹුරේ දක්වෙන පරිදි ජූලියස් ජයතිලකට හා වෙනත් අයට අයිති ගොඩපොරගහවත්ත නමැති ඉඩමෙන් ද ; බස්නාහිරින් : අංක 204 දරණ එකී පිඹුරේ දක්වෙන දේවස්ථානයේ නැගෙනහිර බිත්තියට සමාන්තරව එකී නැගෙනහිර බිත්තියේ සිට අඩි 10ක් නැගෙනහිරින් විහිදෙන රේඛාවකින් ද මායිම්වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි."

8-924/10

---

## 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

### ක/උතුරු කළුතර මෙතෝදිස්ත සිංහල මිශ්‍ර පාසල, කළුතර

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජපාඅද/891,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු 18 වැනි දින දීය.

### නියෝගය

කළුතර, ක/උතුරු කළුතර මෙතෝදිස්ත සිංහල මිශ්‍ර පාසල සම්බන්ධයෙන්, 1962 වර්ෂයේ මැයි මස 14 වෙනි දින අංක 13,109 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1,249 දරණ පැවරුම් නියෝගයේ උපලේඛනයේ 1 වැනි ඡේදය අවසානයෙ ඇති නැවතීමේ ලකුණ වෙනුවට කොමා ලකුණ යෙදීමෙන් හා ඊලඟට මතු දක්වෙන කොටස එකතු කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"බලයලත් මැනුම්කරු හා මට්ටම්කරු ඇල්. ආර්. ඇල්. පෙරේරා මහතා විසින් සාදනලද 1955.1.18 දින හා අංක 479 දරණ පිඹුරේ අංක 2 දරණ බිම් කැබැල්ල ලෙස දක්වා ඇති ඉඩමටද ඊ. ආර්. මැන්ඩිස් මහතා විසින් හිමිකම් කියන එකී දේපොළටද එකී අංක 479 දරණ පිඹුරේ දක්වා තිබෙන පාර ඔස්සේ ප්‍රවේශවීමේ අයිතිය ඇතිව."

8-924/11

---

## 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

### මී/බෝලවලාන (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසැල, මීගමුව

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජපාඅද/1001,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 වැනි දින දීය.

### නියෝගය

මීගමුවේ, මී/බෝලවලාන (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසැල සම්බන්ධයෙන්, 1962 මැයි මස 14 වෙනි දින අංක 13,109 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1252 දරණ පැවරුම් නියෝගය, එහි උපලේඛණයේ 1 වෙනි ඡේදය වෙනුවට මතු දක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1. 1960 වර්ෂයේ ජූලි මස 21 වෙනි දින මීගමුවේ, මී/බෝලවලාන (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසැල පැවැත්වූනාවූත් නඩත්තු කෙරුනාවූත් ස්ථානය, එනම් : බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ උතුර "ඒ" ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ බෝලවලානේ පිහිටි,

උතුරින් : කෙටි තාප්පයකින් වෙන්කරන ලද, යහපත් එඬේරුගේ කන්‍යාරාමය පිහිටි භූමියෙන් ද ;

නැගෙනහිරින් : කම්බි වැටකින් හා පැළ ඉති වැටකින් වෙන්වූ පීටර් පීරිස් සහ ලූකස් දල්පතාදු යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩමෙන් ද ;

දකුණින් : පාසැල් ගොඩනැගිල්ලේ දකුණු බිත්තියට සමාන්තරව එකී බිත්තියට අඩි 15ක් දකුණින් විහිදෙන රේඛාවකින්ද ;

බස්නාහිරින් : ප්‍රධාන පාසැල් ගොඩනැගිල්ලේ බටහිර බිත්තියට සමාන්තරව එකී බටහිර බිත්තියට අඩි 44 ක් බටහිරින් විහිදෙන රේඛාවකින් ද මායිම් වූ ඉඩම් කොටස සම්පූර්ණයෙනි."

8-924/12

---

## 1961 වර්‍ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### මාර/හිත්තැටිය ධම්මරාජ පාසල, මාතර

1961 වර්‍ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජපාඅළු/237/සංපා,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 වන දින දීය.

### නියෝගය

මාතර, මාර/හිත්තැටිය ධම්මරාජ පාඨශාලාව සම්බන්ධයෙන් 1962 ඔක්තෝබර් මස 26 වැනි දින අංක 13,363 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ අංක 2039 දරන පැවරුම් නියෝගය, එහි උපලේඛනයේ 1 වැනි ඡේදය වෙනුවට මතු දක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. "1960 ජූලි මස 21 වැනි දින මාතර, මාර/හිත්තැටිය ධම්මරාජ පාසල පවත්වන ලද භූමි භාගය, එනම්, දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඩවත් සතර තුළ හිත්තැටියේ පිහිටි, හෙන්රි එස්. දියෙස් නම් වූ අවසරලත් මිනින්දෝරු තැන විසින් 1928.12.2 වැනි දින අඳින ලද අංක 327 දරණ ප්ලෑනයෙහි පෙන්වා තිබෙන, කහම්පල කුරුඳුවත්ත නොහොත් පන්සල්වත්ත යයි කියනු ලබන, නැගෙනහිර සිට බටහිරට අඩි 166ක දුර ප්‍රමාණයක් පන්සල්වත්තේ කොටසකින් උතුරෙන් මායිම්වූද, උතුරු මායිමේ සිට අඩි 117ක දුර ප්‍රමාණයක් ගම් සභාපාර නැගෙනහිරට මායිම්වූද, පාසලේ ඉතාම දකුණෙන් පිහිටි ශාලාවේ දකුණු බිත්තියට අඩි 10ක් දකුණෙන් වූ ලක්ෂ්‍යයක සිට නැගෙනහිර සිට බටහිරට විහිදෙන අඩි 178ක් දිග මනඃකල්පිත සරල රේඛාවකින් හා බවුන්ඩාරෙටන්තෙන් (ඉසදීන් නගරය) දකුණට මායිම් වූද, බටහිරට පන්සල්වත්තේ කොටසකින් මායිම්වූද, ප්‍රමාණයෙන් රූඩ් 2ක් (අ. 0, රූ. 2, ප. 0.) වූ බිම් කොටස."

8-924/13

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### ර/කිරපත්දෙනිය (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල, පින්නවල, බලංගොඩ

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළු/329/සාසා.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 දින දීය.

### නියෝගය

බලංගොඩ, පින්නවල, ර/කිරපත්දෙනිය (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල සම්බන්ධයෙන් 1962 මැයි මස 21 වැනි දින අංක 13,125 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1297 දරණ පැවරුම් නියෝගය, එහි උපලේඛනයෙහි 1 වැනි ඡේදය වෙනුවට මතු දක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1. 1960 ජූලි මස 21 දින බලංගොඩ, පින්නවල, ර/කිරපත්දෙනිය (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල පවත්වනු ලැබුවාවූත්, නඩත්තු කරනු ලැබුවාවූත් ස්ථානය, එනම්, සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, උඩගම ගම්මුලාදෑනි වසමේ කිරපත්දෙනියේ පිහිටා ඇති උතුරෙන්, පී. ජී. සිරිබෝහාමි සහ පී. ජී. මුදලිහාමි යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩමෙන්ද, නැගෙනහිරෙන්, හල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් අයිතිවාසිකම් කියනු ලබන අඹගහකුඹුර නමැති ඉඩමෙන්ද, දකුණෙන්, පාසල් ගොඩනැගිල්ලේ ගිණිකොන කෙළවරේ සිට අඩි 54ක් දකුණටද නිරිතදිග කෙළවරේ සිට අඩි 45ක් දකුණටද සිටින සේ නැගෙනහිර සිට බටහිර දෙසට හුරුව විහිදෙන සෘජු රේඛාවකින්ද, බටහිරෙන්, එකී පාසල් ගොඩනැගිල්ලේ බටහිර බිත්තියට සමාන්තරව එහි සිට අඩි 8ක් බටහිරෙන් විහිදෙන රේඛාවකින්ද මායිම්වූ ඉඩම් කොටස සම්පූර්ණයෙනි."

8-924/14

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### හලා/බෝලවත්ත (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසල, වයික්කාල්

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජ පාඅඹ/242/සාපා.,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 අගෝස්තු මස 18 වැනි දින දීය.

### නියෝගය

වයික්කාල්, හලා/බෝලවත්ත (රෝමානු කතෝලික) පිරිමි පාසල සම්බන්ධයෙන් 1962 ජනවාරි මස 27 වැනි දින අංක 12,887 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1962 ජනවාරි මස 23 වැනි දින අංක 760 දරණ පවරා ගැනීමේ නියෝගය, එහි උපලේඛනයෙහි 1 වැනි ඡේදය වෙනුවට මතු දක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1. 1960 ජූලි මස 21 දින වයික්කාල්, හලා/බෝලවත්ත (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසල පවත්වනු ලැබුවාවූත්, නඩත්තු කරනු ලැබුවාවූත් ස්ථානය, එනම්, වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ බෝලවත්තේ පිහිටි, උතුරෙන්, බෝලවත්ත-ලුනුවිල පාරේ සිට අඩි 132 ක් පමණ දුරට විහිදෙන කම්බි වැටකින්, ඇම්. ෆ්‍රැන්සිස් විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩමෙන්ද, නැගෙනහිරෙන්, එකී බෝලවත්ත-ලුනුවිල පාරෙන්ද, දකුණෙන්, ඉතාම දකුණෙන් පිහිටි පාසල් ගොඩනැගිල්ලේ දකුණු බිත්තියේ සිට අඩි 45ක් දකුණු දෙසින් එකී බිත්තියට සමාන්තරව විහිදෙන රේඛාවකින් දේවස්ථාන භූමියේ කොටසකින්ද, බටහිරෙන්, එකී දකුණු දිග පිහිටි පාසල් ගොඩනැගිල්ලේ බටහිර බිත්තියට සමාන්තරව හා එකී උතුරු මායිමේ බටහිර කෙළවරින් ආරම්භව විහිදියන රේඛාවකින් දෙවස්ථාන භූමියේ කොටසකින්ද, මායිම්වූ එකී ඉඩම් කොටස සම්පූර්ණයෙනි."

8-924/15

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි